# කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

ශ්‍රී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම, ශ්‍රී ලංකාව තුළ රසායන නිෂ්පාදනයේ හා අලෙවි කිරීමේ නියුතු සම්පූර්ණයෙන් රජය සතු ලාභ උපදවන හා ස්වයංපෝෂිත සංවිධානයකි. පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසු අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර ( MM-1-1) තනතුරු 01 යි

**තනතුරෙහි වගකීම**

i. වඩාත් හොඳ හා පහසු මූල්‍ය කළමනාකරණය සහ කාර්යක්ෂම/ ඵලදායී අරමුදල් කළමනාකරණයද සඳහා ඒකාග්‍රතාවය සහතික කරමින් අවශ්‍ය අභ්‍යන්තර පාලන හා පිරික්සුම් පද්ධති හඳුන්වාදීම.

ii. නිෂ්පාදන හා සැකසීම් පිරිවැය හා අයවැය සැකසීම

iii. මූල්‍ය දත්ත හැකියාව විශ්ලේෂණය කිරීම හා සියලුම ව්‍යාපාරික හා මෙහෙයුම් කාර්යයන්හි මූලෝපායික තීරණ ගැනීමට කළමනාකරණයට සහාය වීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ්‍ය/ ගිණුම්කරණය/ මුදල්/ ව්‍යාපාර පරිපාලනය (මුදල් / ගිණුම්) / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ B.Sc උපාධිය

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

2. තනතුරට හා විෂය පථයට අදාළ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත් වීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය ඉහත සඳහන් සුදුසුකම් ලබා තිබීම.

2. තනතුරට අදාළ කනිෂ්ඨ කළමනාකරු (JM) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ)

**වැටුප් පරිමාණය : MM 1-1**

රු. 53,175-10X1,375-15X1,910-95,575 වාර්ෂිකව මූලික වැටුප රු. 53,175/- ජීවන වියදම් දීමනාව රු. 7,800/- සහ අයවැය දීමනාව රු. 5,000/- ප්‍රවාහන දීමනාව රු. 15,000/- මාසිකව.

**ඉහත තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය**

ලිඛිත තරඟකාරී විභාගයකින් සහ / හෝ පත්කිරීමේ බලධාරී විසින් පත් කරනු ලබන පැනලයක් / මණ්ඩලයක් මගින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**සෑම අයදුම්කරුවකුම**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරෙහි රාජකාරී මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු විය යුතුය.

iii. විශිෂ්ට යහපත් චරිතයකින් හෙබි විය යුතුය.

**වෙනත් වරප්‍රසාද**

මාසික පැමිණීමේ දිරි දීමනාව හා වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවනු ලැබේ. ආයතනය මගින් සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබාදෙනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ආයතනයේ දායකත්වය පිළිවෙලින් 15% ක් හා 3% ක් වේ. සේවකයා විසින් සේ. අ. අරමුදලට සිය වැටුපින් 10% කින් දායක විය යුතුය.

**අයදුම්කරන පිළිවෙල**

අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත දැනීම් ඇති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත අයදුම්පත් අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් සමඟ 2022.08.04 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය සංස්ථා/ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. කෙටි ලැයිස්තුගත යෝග්‍යතා පූර්ණ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

**සභාපති, ශ්‍රී/ස. පරන්තන් කෙමිකල් සමාගම,**
**446, ගාලුපාර, රත්මලාන.**
**0112-324466/ 0112-437556**
***www.pccl.gov.lk***